**ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය**
**(සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය)**

# ඇබෑර්තු

ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් ස්ථිර තනතුරු සඳහා මූලික සුදුසුකම් සපුරා ඇති පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## <u>කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) තනතුරු - 04</u>

**සුදුසුකම්**

1. අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල / දෙමළ හා ගණිතය ඇතුළු විෂයන් 04 කට සම්මාන සාමාර්ථයන් සහිතව විෂයන් 06 කින් එකවර සමත්ව තිබීම.

2. අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් අවම වශයෙන් විෂයන් 03 ක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

3. පරිගණක වදන් සැකසුම / යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන් අතිරේක සුදුසුකමක් වශයෙන් සළකනු ලැබේ.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

1. ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන, අර්ධ ශිල්පීය සහ ශිල්පීය සේවා ගණයන්හි 'ආ', 'ඇ' සහ ' ඈ' සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.
2. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී,
   i. සිංහල / දෙමළ
   ii. ගණිතය

   යන විෂයයන් ඇතුළුව විෂයයන් හතර (04)කට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හය (06)කින් සමත්ව තිබීම. පරිගණක වදන් සැකසුම / යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදාරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවන් අතිරේක සුදුසුකමක් වශයෙන් සළකනු ලැබේ.
3. සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම්වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.
4. නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**වයස් සීමාව** - අවුරුදු 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**වැටුප් ක්‍රමය** - 2016.04.25 දිනැති 02/2016 කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව 2020 සිට ඔබේ තනතුරට හිමි වැටුප් පරිමාණය MA 1-1 2016 රු. 27, 910 - 10x300 - 7x350 - 4x495 - 20x660 - 48, 540 ක් වේ.
බඳවා ගැනීමේ දි වැටුප් තලය රු. 22, 126.00 වේ.

**වෙනත් දීමනා** - රජය මගින් අනුමත දීමනා හිමිවේ.

පොදු කොන්දේසි

සෑම ඉල්ලුම්කරුවකුම,

- ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
- විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සපුරාලීමට හැකියාව තිබිය යුතු ය.
- පරිගණක භාවිතය පිළිබඳ දැනුම හා ඒ පිළිබඳ වෘත්තීය අධ්‍යාපන සුදුසුකම් ලබා තිබිය යුතුය.

මෙම තනතුර ස්ථිරය. සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක විය යුතු ය. වසර තුනක පරිවාස කාලයකින් පසු සේවය ස්ථිර කරනු ලැබේ. ලිඛිත තරඟ විභාගයක් හෝ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල මත තනතුරු සඳහා බඳවා ගනු ලැබේ. ඇමුණුම 01 හි සඳහන් අයදුම්පත 2018.07.20 දිනට පෙර "සභාපති, ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය, අංක 18, රාජගිරිය පාර, රාජගිරිය" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවීම හෝ ප්‍රධාන කාර්යාලයේ පාලන අංශය වෙත ගෙනවිත් බාරදීම කළ යුතු ය. දැනටමත් රාජ්‍ය අංශයේ හෝ ව්‍යවස්ථාපිත ආයතන වල සේවය කරන අයදුම්කරුවන් ආයතන ප්‍රධානියා මඟින් අයදුම්කළ යුතු ය. අයදුම්පත එවන ලිපි කවරයේ වම් ඉහළ කෙළවරෙහි අයදුම්කරනු ලබන තනතුර සඳහන් කර තිබිය යුතු ය.

සෝමචන්ද්‍ර ජයකොඩි
සභාපති
ශ්‍රී ලංකා සමාජ ආරක්ෂණ මණ්ඩලය
"සමාජ ආරක්ෂණ පියස",
අංක 18, රාජගිරිය පාර, රාජගිරිය.

2018.07.06